www.agaram.lk

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | නර්තනය | ඒකකය : 5 |
|---|---|---|

## සරඹ

**(නමස්කාරය, පා සරඹ, ගොඩ සරඹ)**

- **ප්‍රශ්න අංක 01 සිට 11 දක්වා හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන තුල යොදන්න.**

(1) නමස්කාරයේ දී ගැට බෙරය වාදනය කරයි. ( )

(2) නමස්කාරයේ දී නමස්කාර පදය හඬ නගා නිවැරදිව කිව යුතුය. ( )

(3) නමස්කාර සරඹය කරනුයේ තුන් වතාවක් පමණි. ( )

(4) නමස්කාරයේ දී පළමු වැඳීම දෙවියන් උදෙසාය. ( )

(5) පා සරඹ නැටීමේ දී පාද චලන පමණක් ප්‍රමුඛ වේ. ( )

(6) නර්තනයේ අලංකාරය සඳහා මූලික අංගහාර ලක්ෂණ පවත්වා ගැනීම වැදගත් වේ. ( )

(7) උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායන් තුනෙහිම පා සරඹ 12 බැගින් දක්නට ලැබේ.( )

(8) මණ්ඩියට සිටින විට දෙපා අතර දුර ප්‍රමාණය හඳුන්වන්නේ 'වියත' නමිනි. ( )

(9) උඩරට නර්තන සම්ප්‍රදායේ පා සරඹ නැටීමේ දී පාද චලන හා හස්ත චලන භාවිත කෙරේ. ( )

(10) පා සරඹ නැටීමේ දී ගැටබෙරය වාදනය නොකෙරේ. ( )

(11) නමස්කාර පදයේ පළමු වැඳීම කරනු ලබන්නේ තමන් ඉගෙන ගනු ලබන ශිල්ප ශාස්ත්‍රයට වේ. ( )

agaram.lk

- **වරහන තුළ ඇති නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(12) පා සරඹ නැටීමේ දී ........................................................ එහි සුවිශේෂ ලක්ෂණයකි.
(බෙර වාදනයට අනුව නැටීම / කටින් පද කියා නැටීම)

(13) සෑම පා සරඹයක් අවසානයේදීම නටනු ලබන පද කොටස ........................................................ නමින් හැඳින්වේ. (කස්තිරම / හමාර පදය)

(14) පා සරඹ නැටීමේදී තාල තැබීම සඳහා ........................................................ යොදා ගනී.
(තාලම්පට / බෙරය)

(15) සරඹ අභ්‍යාසයේදී නර්තන ශිල්පියා සිටින මූලික ඉරියව්ව ........................................................ නමින් හඳුන්වයි. (මණ්ඩිය / දණ්ඩිය)

(16) උඩරට නර්තන සම්ප්‍රදායේ දී පාද හුරු කරවන සරඹ වර්ගය ........................................................ නමින් හඳුන්වයි. (ගොඩ සරඹ / පා සරඹ)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

- ප්‍රශ්න අංක 17 සිට 30 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(17) තෙයියත් තෙයියත් තෙයියත් තාම් //// යනුවෙන් උඩරට නර්තන සම්ප්‍රදායේ දී කරනු ලබන්නේ,
1) පා සරඹයයි. 2) නමස්කාර පදයයි. 3) දොඹින පදයයි. 4) ගොඩ සරඹයයි.

(18) නර්තනයට ප්‍රවේශ වන ආධුනිකයා ප්‍රථමයෙන්ම අභ්‍යාස කරනු ලබන්නේ,
1) ඉලංගම් සරඹයි. 2) පා සරඹයි. 3) දොඹින පදයි. 4) ගොඩ සරඹයි.

(19) පා සරඹ නැටීමේ දී යොදා ගනු ලබන ආධාරකය හඳුන්වන්නේ කුමන නමින් ද?
1) ඉලංගම 2) තාලම්පට 3) බෙරය 4) දණ්ඩි කඳ

(20) දණ්ඩි කඳ සකස් කර ගන්නේ,
1) ආධුනිකයාගේ තන මත්තක් උසිනි. 2) ඉණ තෙක් පමණ උසිනි.
3) දණහිස තෙක් පමණ උසිනි. 4) නිශ්චිත උස ප්‍රමාණයක් නැත.

(21) 'තෙයි' යන පද භාවිතා කරන්නේ,
1) බෙර වාදනයේ දී ය. 2) සරඹ නැටීමේදී ය.
3) තාලම්පට වාදනයේදී ය. 4) නමණීයකරණ අභ්‍යාසවලදී ය.

(22) සබරගමු සම්ප්‍රදායේ පාද හුරු කර ගැනීමේ සරඹ අභ්‍යාස හඳුන්වන්නේ කුමන නමින් ද?
1) මාත්‍රා පද 2) මණ්ඩි පද 3) ගොඩ සරඹ 4) දණ්ඩි සරඹ

(23) ගොඩ සරඹ හඳුන්වන තවත් නමක් වනුයේ,
1) දණ්ඩි සරඹ 2) පා සරඹ 3) අත් සරඹ 4) ඉලංගම් සරඹ

(24) උඩරට නර්තනයේදී දෑත් හුරු කරවන සරඹ විශේෂය කුමක් ද?
1) පා සරඹ 2) ගොඩ සරඹ 3) දණ්ඩි සරඹ 4) ඉලංගම් සරඹ

(25) ආධුනිකයාගේ හස්ත පාද සමායෝජනය සඳහා යොදා ගනු ලබන සරඹ විශේෂය කුමක් ද?
1) පා සරඹ / දණ්ඩි සරඹ / බෙර සරඹ 2) ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද
3) අත් සරඹ / පා සරඹ / බෙර සරඹ 4) දණ්ඩි සරඹ / බෙර සරඹ / මාත්‍රා පද

(26) ගොඩ සරඹයක් අවසානයේ නටනු ලබන්නේ,
1) ඉරට්ටියයි. 2) කස්තිරමයි. 3) හමාර පදයයි. 4) කලාසමයි.

(27) සම්පූර්ණ ගොඩ සරඹ සංඛ්‍යාව,
1) 3 කි 2) 8 කි 3) 10 කි 4) 12 කි

(28) ගොඩ සරඹ නර්තනය කරනු ලබන්නේ,
1) මාත්‍රා 2 තාලයට / සුළු තනි තිතට 2) මාත්‍රා 3 තාලයට / මැදුම් තනි තිතට
3) මාත්‍රා 4 තාලයට / මහ තනි තිතට 4) මාත්‍රා 2 + 3 තාලයට / සුළු මැදුම් දෙතිතට

(29) ගොඩ සරඹ නර්තනය කිරීම මගින්,
1) ගායනය සමඟ නර්තනයේ යෙදීමේ හැකියාව ලබයි.
2) රිද්මයානුකූල චලන හඳුනාගනී.
3) සම්ප්‍රදායට අදාල අංගහාර හඳුනා ගනී.
4) චරිත නිරූපණයට දක්ෂතාව ඇති කර ගනී.

(30) පහතරට අත් සරඹ මාලාව හඳුන්වන සාම්ප්‍රදායික නාමය කුමක් ද?
1) ගොඩ සරඹ 2) ඉලංගම් සරඹ 3) දොඹින පද 4) ඉරට්ටිය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

- **කෙටි පිළිතුරු සපයන්න.**

(31) නමස්කාර සරඹය ලියන්න.
(32) නමස්කාර සරඹයේ අදහස ලියන්න.
(33) ගුරු නමස්කාර ගාථාව ලියන්න.
(34) ගුරු නමස්කාර ගාථාවේ අර්ථය ලියන්න.
(35) මණ්ඩිය යනු කුමක් ද?
(36) මණ්ඩියේ මූලික ලක්ෂණ 2 ක් ලියන්න.
(37) පා සරඹ හඳුන්වන තවත් නමක් ලියන්න.
(38) පළමු පා සරඹ පදයේ සරඹ නාමය කුමක් ද?
(39) පළමු පා සරඹ පදය ලියන්න.
(40) දෙවන පා සරඹ පදයේ සරඹ නාමය කුමක් ද?
(41) දෙවන පා සරඹ පදය ලියන්න.
(42) තුන්වන පා සරඹ පදයේ සරඹ නාමය කුමක් ද?
(43) තුන්වන පා සරඹ පදය ලියන්න.
(44) උඩරට පා සරඹවල හමාර පදය ලියන්න.
(45) පළමු ගොඩ සරඹයේ සරඹ නාමය කුමක් ද?
(46) පළමු ගොඩ සරඹ පදය ලියන්න.
(47) පළමු ගොඩ සරඹයේ කස්තිරම ලියන්න.
(48) දෙවන ගොඩ සරඹයේ සරඹ නාමය කුමක් ද?
(49) දෙවන ගොඩ සරඹයේ කස්තිරම ලියන්න.
(50) ආධුනිකයන් සරඹ අභ්‍යාසවල යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk